යාපනය මහා නගර සභාව
යාපනය දිස්ත්‍රික්කය
--------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ කොමසාරිස් වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට යාපනය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් ඉඩම් සහ ගොඩනැගිලිවල වටිනාකම් තක්සේරු කර අවසන් ගිණුම්වල හෙළිදරව්කර නොතිබුණි.

(ආ) පළාත් පාලන සේවයේ නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවිය යුතුව තිබූ රු. 115,492,502 ක මුදල සඳහා විශ්‍රාම වැටුප් වෙන්කිරීම් කර නොතිබූ අතර ගෙවියයුතු මුදල අවසන් ගිණුම්වල වගකීමක් වශයෙන් දක්වා නොතිබුණි.

(ඇ) සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ, අයිතිය සභාව වෙත පවරා නොතිබූ මෝටර් වාහන 46 ක වටිනාකම ගිණුම්වලට ගෙනවිත් නොතිබීමෙන් මෝටර් වාහනවල වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබියයුතු ගිණුම්
---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 5 ක් ඉක්මවූ රු. 7,112,085 ක අත්තිකාරම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්‍රාමිකයින් 138 දෙනෙකුගෙන් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු. 663,200 ණය ශේෂ මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

අවශ්‍ය සාක්ෂි 3 ක් නොමැතිවීමේ හේතුවෙන් රු. 143,720 ක් වටිනා ගනුදෙනු විගණනයෙදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 මහානගර සභා ආඥා පනත (252 වන අධිකාරය) | |
| (i) 42(1) වගන්තිය | සභාව සතු තාවකාලික කඩ කාමර 17 ක් ස්ථිර කඩ කාමර වශයෙන් ඉදිකිරීමේදී අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සභාව විසින් කටයුතු කර නොතිබුණි. |
| (ii) 42(අ) වගන්තිය | සභා බලප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ සංනිවේදන කුළුනු 19 ක අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 381(3) | චෙක්පත්වල අත්සන්කිරීම සඳහා බලය පවරා තිබූ නිලධාරීන් විසින් ඇප මුදල් ගෙවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | රු. 4,453,860 ක් වටිනා වර්ෂ දෙකක් ඉක්මවූ විවිධ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 849(2) | රු. 40,655 ක ජාත්‍යන්තර ඇමතුම් ගාස්තු සහා අරමුදලින් ගෙවාතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය 1990 ඔක්තෝබර් 10 වන දිනැති අංක 41/90 | සභාව සතු වාහන 36 ක ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 143,963,688 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 144,760,154 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 796,466 ක පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්ත රු. 90,749,375 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 134,707,047 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රතිඵලය රු. 43,957,672 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

------------------------------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 669,060,896 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 581,228,518 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු. 87,832,378 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය

------------------------

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය

-------------------------------------

කොමසාරිස් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | 2016<br>තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 60,800 | 74,086 | 77,968 |
| බදු කුලී | 90,292 | 78,669 | 5,932 |
| බලපත්‍ර ගාස්තු | 22,405 | 20,450 | 2,968 |
| වෙනත් ආදායම් | 684,253 | 634,230 | 362,073 |
| එකතුව | 857,750 | 807,435 | 448,941 |

2.4.2 වරිපනම් බදු

--------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආදායම් පරීක්ෂක විසින් අදාල වර්ෂයේ වරිපනම් බදු නොගෙවූ අය පිළිබඳ ලැස්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ආ) රු. 77,968,600 ක හිඟ වරිපනම් බදු මෙතෙක් අයකර නොතිබුණි.

2.4.3 කඩ කුලි

---------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු කඩ කාමර 196 ක අයිතිය සම්ප්‍රදාය අනුව මාරු කර තිබුණද නීත්‍යානුකූලව මාරුකර නොතිබුණි.

(ආ) රු. 1,232,634 ක හිඟ බදු කුලි මුදලක් පැවතුණද, එය මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

(ඇ) රු. 1,733,302 ක කඩකුලි මෙතෙක් අයකර නොතිබුණි.

2.4.4 බලපත්‍ර ගාස්තු

----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 283,734 ක පොළ කඩ කාමර බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ආ) රු. 671,961 ක් වෙළඳ බලපත්‍ර ගාස්තු සහ ව්‍යාපාර බදු මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

2.4.5 මුද්දර ගාස්තු

--------------

ඉඩම් රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් ලැබියයුතු මුද්දර ගාස්තු රු. 260,271,306 ක මුදල මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 1,250 ක් වුවද තත්‍ය සේවක සංඛ්‍යාව 1,106 කි. ඒ අනුව පුරප්පාඩු සේවක සංඛ්‍යාව 146 ක්ද අතිරික්ත සේවක සංඛ්‍යාව 02 ක්ද තිබුණි.

(ආ) (i) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් නොමැති විදුලි කාර්මිකයන්ට විරුද්ධව කටයුතු කර තිබුණද, වෘත්තිය සුදුසුකම් නොමැති විදුලි කාර්මිකයට එරෙහිව කටයුතු කර නොතිබුණි.

(ii) ගිණි නිවීමේ සේවයේ සේවා සටහන් 16.3 අනුව වර්ෂ 3 ක් ඇතුලත අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා ගත යුතු බව සඳහන් කර පත්වීම් ලබාදී තිබුණද, ඉන් 03 දෙනෙකු අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් මෙතෙක් සම්පූර්ණකර නොතිබුණි.

(ඇ) විදුලි අංශයට අයත් රු. 3,710 ක මුදල් අඩුවීම් සහ රු. 21,222 ක් වටිනා අගුරු චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු නොකර වර්ෂ පහකට වඩා වැඩි කාලයක සිට දිගටම අත්තිකාරම් ගිණුමේ ඇතුලත් කර තිබුණි.

(ඈ) බැංකුවල තැන්පත් කිරීමේදී අනුමත බැංකුවල පමණක් තැන්පත් කළයුතුය. කෙසේවුවද, පෞද්ගලික බැංකුවක (Commercial Bank) රු. 21,653,627 ක මුදලක් තැන්පත් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) (i) වැඩපොළ අංශයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වර්තාව අනුව භාණ්ඩ 275 ක ඌනතාවයක් හා භාණ්ඩ 76 ක අතිරික්තයක්ද තිබුණි.

(ii) මහජන පුස්තකාලයේ පොත් 1,741 ක් අස්ථාන ගතවී ඇති බව භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් කර තිබුණද මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 132,825,506 ක වෙන්කිරීම් නිෂ්කාර්යව පැවතුනි.

(ආ) රු. 9,060,635 ක නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදල් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු
---------------------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුලි පදනම මත ලබාගත් වාහන සඳහා 2012 වර්ෂයේදී සහා අරමුදලින් ගෙවන ලද රු. 611,000 ක මුදල මෙතෙක් නිරවුල් කර නොතිබුණි.

(ආ) කස්තුරියාර් වීදියේ සාප්පු ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ කාර්මාන්තය සඳහා මහ නගර සභාවට අයත් ඉඩමේ පුද්ගලික පාර්ශවයන් විසින් සාප්පු ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීම සඳහා පහත සඳහන් ආයතනයවලින් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

  (i) අදාල අමාත්‍යාංශය
  (ii) යාපනය මහා නගර සභාව
  (iii) සංචාරක අංශය
  (iv) මධ්‍යම පරිසර අධිකාරිය
  (v) නාගරික සංවර්ධන අධිකාරි

3.4 ඌන උපයෝජිත වත්කම්
-----------------------------
සභාවට අයත් වාහන 17 ක් නිෂ්ක්‍රීය තත්ත්වයේ තිබුණි.

3.5 හඳුනාගත් පාඩු
----------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පික්කප් වාහනයට සිදුවූ අනතුර සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII(1) වන පරිච්ජේදය අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) මහ නගර සභාවේ කළමනාකරණ සහකාර විසින් 2016 වර්ෂයේදී රු. 2,934,429 ක් මුදල් අයථා පරිහරණය කර තිබුණි. එම මුදලින් රු. 320,000 ක් පමණක් ආපසු අයකර ගෙන තිබූ අතර ඉතිරි රු. 2,614,429 ක මුදල අදාල නිලධාරියාගෙන් අයකරගෙන නොතිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 1,371,756 ක් වටිනා අධියර I යටතේ ඉටුකරන ලද වැඩකොටස මහ නගර සභාව විසින් සහතික කර නොතිබුණි.

(ආ) අධියර II යටත් ඉටු කරන ලද වැඩ ප්‍රමාණය සහ එහි වටිනාකම් රු. 5,096,340 ක් විගණනයේදී සනාථ කරගත නොහැකි විය.

(ඇ) කොන්ත්‍රාත්කරුවකු විසින් ඉටුකරන ලද රු. 14,440,804 ක් වටිනා කාක්කයිතීවු අපවිත්‍ර ජල පවිත්‍ර කිරීමේ කර්මාන්තයේ ඉටුකළ වැඩ ප්‍රමාණයට වඩා වැඩියෙන් ගෙවා තිබීම නිසා රු. 399,349 ක වැඩිපුර ගෙවීමක් සිදුව තිබුණි.

(ඈ) කොන්ත්‍රාත්කරුවකු විසින් ඉටුකරන ලද රු. 5,096,340 ක් වටිනා නගර සභාවේ ගිණි නිවන අංශයේ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ අධියර III හි ඉදිකිරීම් කර්මාන්තයේ ඉටුකළ වැඩ ප්‍රමාණයට වඩා වැඩියෙන් ගෙවීම් කර තිබීම නිසා රු. 303,488 ක වැඩිපුර ගෙවීමක් සිදුව තිබුණි.

3.7 ප්‍රමාදවූ ව්‍යාපෘති

---------------

සමාලෝචිත වර්ෂයේ ඉටුකළයුතු රු. 9,417,842 ක් වටිනා ප්‍රාග්ධන වැඩ 4 ක් මෙතෙක් නිමකර නොතිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

මුදල් වර්ෂයට අදාල මුදල් ප්‍රවාහ ප්‍රකාශය සභාව විසින් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 අයවැය පාලනය

-----------------

වියදම් ව්‍යුහය

---------------

අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 41,608 සිට රු. 50,206,032 දක්වා වියදම් විචලනයක් විගණනයේදී නිරික්ෂණය විය.

5. පද්ධති හා පාලන

------------------

පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් රැස්කිරීම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) සේවක සංඛ්‍යා
(ඉ) පරිත්‍යාග
(ඊ) වාහන උපයෝජනය
(උ) විවිධ තැන්පත්
(ඌ) අයවැය